# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය

## මාර්ග සංවර්ධන අධිකාරිය

# ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත්භාර අධ්‍යක්ෂ (ද.ප) කාර්යාලයීය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන ව්‍යාපෘති සඳහා පහත සඳහන් යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසු කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල (වැට් බදු හා අවිනිශ්චිත වියදම් රහිත) රු.මි. | CIDA නිපුණතාවය | ලංසු ආරක්ෂණය රු. | කොන්ත්‍රාත් කාලය |
|---|---|---|---|---|---|---|
| 01 | MOH/RDA/RR/SP/HMB/2024/01 | බෝධිරාජ මාවත වැඩි දියුණු කිරීම | 11.30 | C6 සහ C5 | 132,000.00 | 90 |
| 02 | MOH/RDA/RR/SP/MTR/2024/01 | පරාක්‍රම මාවත වැඩි දියුණු කිරීම. | 8.30 | C6 සහ C5 | 106,000.00 | 90 |
| 03 | RDA/SP/GAL/RMTF/2024/01 | ගාල්ල බද්දේගම මාර්ගයේ කි.මී.3+450 සිට 3+665 දක්වා කොටසෙහි කාණු පද්ධතිය ඉදිකිරීම | 17.50 | C6 සහ C5 | 205,000.00 | 90 |

02. ඉහත සඳහන් ව්‍යාපෘති Interlock ගල් , කොන්ක්‍රීට් හා ඇස්පෝල්ට් (Asphalt) වැඩ වලින් සමන්විත වේ.

03. මෙම ප්‍රසම්පාදනය ජාතික තරඟකාරී ලංසු තැබීම (NCB) හරහා සිදු කෙරේ. මෙම ප්‍රසම්පාදනය යටතේ (වැට් බදු සහ අනෙකුත් බදු හැර) සිදු කිරීමට නියමිත වැඩ වල ඇස්තමේන්තු වටිනාකම රු.මි. 50 ට අඩු බැවින් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛනයේ අංක 04/2026 (iii) හි කලාපීය මනාපය සහ CIDA ශ්‍රේණියේ මනාපය සලකනු ලැබේ .

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් මහාමාර්ග විශේෂත්වය යටතේ ඉහත වගුවේ දක්වා ඇති පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) අදාළ ශ්‍රේණියේ ලියාපදිංචි වී සිටිය යුතුය.

05. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024/07/01** දින සිට පහත සඳහන් කාර්යාල වලින් ලංසු ලේඛණ පරීක්ෂා කිරීම සිදුකල හැකි අතර **2024/07/01** දින සිට **2024/07/15** දින දක්වා 9.00 පැය සිට 16.00 පැය දක්වා කාලයේදී පහත සඳහන් කාර්යාල වලින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

- පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය (දකුණ), මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර
  දු.ක 041-2222150/ 041-2226109 ෆැක්ස්. 041-2222413 ඊ මේල්- rdapdsp@gmail.com

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (ගාල්ල) මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල
  දු.ක 0912234891

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය(මාතර), මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත , මාතර
  දු.ක 041-2222546

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (හම්බන්තොට), මාර්ග සංවර්ධන අධිකාරිය, තංගල්ල
  දු.ක 047-2240363

06. පූර්ව ලංසු රැස්වීම **2024.07.08** දින පෙ.ව. **10.00** ට මාතර, මැද්දවත්ත, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලයේදී පැවැත්වෙන අතර වැඩ බිම් පරීක්ෂාව ලංසු රැස්වීමෙන් පසු යොදා ගනු ලැබේ.

07. මේ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් **2024.07.01** දින සිට **2024.07.15** දින දක්වා පෙ.ව.09.00 සිට ප.ව 03.00 දක්වා කාලය තුළ එක් මිළ ගණන් පතක් සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 4,130.00 (වැට් බදු සහිත ) ගාස්තුවක් බැගින් ලිඛිත අයදුම්පතක් "පළාත්භාර අධ්‍යක්ෂ (දකුණු පළාත), මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර" වෙත ඉදිරිපත් කිරීමෙන් මිළ ගණන් ඉදිරිපත් කිරීමට අදාල අයදුම්පත් ලබාගත හැකිය.

1987 අංක 03 දරණ කොන්ත්‍රාත් සඳහා වන සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු පනත යටතේ පොදු කොන්ත්‍රාත් පිළිබඳව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ ලියාපදිංචි සහතිකය මේ සඳහා ඉදිරිපත් වන නියෝජිතයින් සහ ලංසු වල සාර්ථක ජයග්‍රාහකයන් සතුව තිබිය යුතුය.

08. ලංසුව ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමකින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර **2024.11.12** දක්වා එකී ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය.ලංසු ආරක්ෂණයක් නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. ලංසුව **2024.10.15** දින දක්වා වලංගු වේ.

10. සම්පූර්ණ කළ ලංසුව තවත් පිටපතක් ද සහිතව ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි අදාළ කොන්ත්‍රාත්තුවේ අංකය සදහන් කර සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය (දකුණු පළාත ), මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර යන ලිපිනයට **2024.07.16** දින ප.ව.. **02.00** ට පෙර ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදුකළ යුතුය. ප්‍රමාද වී ලැබෙන මිළ ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිළ ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ එකී මිළ ගණන් පත් විවෘත කරනු ලැබේ.

සභාපති

ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව

පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය (දකුණු පළාත)

මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර